සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** ආදි මිනිසුන් කණ්ඩායම් වශයෙන් ජීවත්වීම ආරම්භ කළේ කවර කාලයකට පෙර ද?
(1) ක්‍රි.පූ. 3000 (2) ක්‍රි.පූ. 5000 (3) ක්‍රි.පූ. 8000 (4) ක්‍රි.පූ. 30 000 (5) ක්‍රි.පූ. 40 000

**2.** ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ ස්ථාන තුනක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) යුදයාව, සුමේරියාව, ගලීලය
(2) සුමේරියාව, ජෙරුසලම, කානා
(3) සමරියාව, මෙසපොතේමියාව, යුදයාව
(4) ගලීලය, නාසරෙත්, ජෙරුසලම
(5) නාසරෙත්, බැබිලෝනියාව, කානා

**3.** මිසරයේ ඊශ්‍රායෙල්වරුන් වහල් මෙහෙයේ යෙදී සිටි සමයේ පාලනය කළ රජතුමා කවු ද?
(1) නෙබුකද්නෙසාර් (2) දෙවන රම්සේස් (3) සාර්ගොන් (4) සයිරස් (5) එපිපානෙස්

**4.** ජනවන්දනාව සඳහා වල්ගේට් ලතින් බයිබලය භාවිත කිරීමට තීරණය කරන ලද ජගත් මන්ත්‍රණ සභාව වන්නේ,
(1) නිසියා ය.
(2) කැල්සිඩොන් ය.
(3) එපේසස් ය.
(4) ත්‍රිදෙන්තියානු ය.
(5) පළමු වතිකානු ය.

**5.** පලස්තීන මුහුදු තීරයේ දකුණු භාගයේ දිවි ගෙවූ ජනතාව වන්නේ,
(1) පිලිස්තිවරුන් ය.
(2) ෆිනිසියානුවරුන් ය.
(3) මැකබිවරුන් ය.
(4) ඒදොම් වැසියන් ය.
(5) මොවබ්වරුන් ය.

**6.** පලස්තීනයේ බටහිර කඳුවල පිහිටා **නොමැත්තේ**,
(1) ඉහළ ගලීලය ය.
(2) ජෙරුසලෙම ය.
(3) සමරියාව ය.
(4) හේබ්‍රොන් ය.
(5) කාර්මෙල් කන්ද ය.

**7.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - බැසිලිකා දෙව් මැදුර සෘජුකෝණස්‍රාකාරව ගොඩනගා ඇත.
B - අහස් නැගීමේ දෙව් මැදුර පිහිටා ඇත්තේ කොන්ස්තන්තිනෝපලයෙහි ය.
C - ක්‍රිස්තුන් වහන්සේ උත්පත්තියේ දෙව් මැදුර පිහිටා ඇත්තේ බෙත්ලෙහෙමෙහි ය.
D - ශුද්ධාත්මයාණන් වහන්සේගේ දේවස්ථානය පිහිටියේ ඔලිව් කන්දේ ය.
E - ක්‍රිස්තුන් වහන්සේගේ සිරුර තැන්පත් කර ඇති දෙව් මැදුර පිහිටියේ කල්වාරි කන්දේ ය.
මෙවායින් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, C සහ E (3) B, C සහ D (4) B, C සහ E (5) C, D සහ E

tamilguru.lk

[දෙවැනි පිටුව බලන්න.

**8.** ඊශ්‍රායෙලයේ විනිශ්චයකාරවරුන්ට පවරන ලද ප්‍රධාන කාර්යක් **නොවන්නේ,**
(1) සමාජය තුළ නීති තහවුරු කිරීම ය.
(2) ගැටුම් නිරාකරණය කිරීම ය.
(3) අන්‍ය ජාතික ආක්‍රමණයන්ගෙන් මුදා ගැනීම ය.
(4) ගිවිසුමට පක්ෂපාතිවීමට දිරිමත් කිරීම ය.
(5) ජෙරුසලමේ දේව මාලිගයට ගොස් පාස්කුව පැවැත්වීමට දිරිමත් කිරීම ය.

**9.** සැම්සන්ගේ ප්‍රධාන දායකත්වය වූයේ ඊශ්‍රායෙල් ජනතාව කවර ජාතීන්ගෙන් මුදවා ගැනීම ද?
(1) ඊජිප්තුවරුන්ගෙන් (2) ඒදොම්වරුන්ගෙන්
(3) පිලිස්තිවරුන්ගෙන් (4) ෆිනිසියානුවරුන්ගෙන්
(5) අසිරියානුවන්ගෙන්

**10.** ඊශ්‍රායෙලයේ රජවරුන් සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - රතු මුහුද අසල වරායක් ගොඩනැගීම
B - ප්‍රඥාවන්තව ක්‍රියා කිරීමට දේව අනුග්‍රහය ඇයැද සිටීම
C - මරණය දක්වා ම යාහ්වේ දෙවියන් වහන්සේට විශ්වාස පක්ෂව සිටීම
D - ජෙරුසලම්හි දේව මන්දියරක් ගොඩ නැගීම
E - අසල්වැසි රටවල් සමග නිතර යුද්ධ කිරීම
මේවායින් සලමන් රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ D (4) B, C සහ D (5) B, C සහ E

**11.** එස්රා සහ නොහෙමියා ක්‍රියාත්මක කාලය වන්නේ,
(1) දාවිත් රජු සමයේ දී ය. (2) සලමන් රජ සමයේ දී ය.
(3) විප්‍රවාස සමයේ දී ය. (4) පර්සියානු පාලන සමයේ දී ය.
(5) ග්‍රීක පාලන සමයේ දී ය.

**12.** මහා ඇලෙක්සැන්ඩර් රජතුමාගේ ඇවෑමෙන් පසුව පලස්තීන දේශය පාලනය කරන ලද රජතුමා කවු ද?
(1) සයිරස් (2) ඇන්ටියෝකුස් එපිපානස්
(3) ටොලමි (4) පොම්පේ
(5) සෙලුසිද්

**13.** මහා හෙරෝද් රජුගෙන් පසුව ජුදයාව පාලනය කරන ලද අර්කලාවුස් එම තනතුරෙන් පහ කරන ලද්දේ,
(1) රෝගී තත්ත්වයෙන් පසු වූ හෙයිනි.
(2) රෝමවරුන්ට විරුද්ධව ග්‍රීකවරුන්ට සහය වූ හෙයිනි.
(3) කෲරතර පාලනයට එරෙහිව ජුදා වැසියන් රෝමයට පැමිණිලි කළ හෙයිනි.
(4) ජෙරුසලමේ අන්‍ය දේව වන්දනාව පැවැත්වීම හා ජනතාවට ද එසේ කිරීමට බලපෑම් කළ හෙයිනි.
(5) ස්නාවක ජුවාම්තුමන්ට එරෙහිව ක්‍රියා කළ හෙයිනි.

**14.** සදිසිවරුන්ගේ ආරම්භය සිදු වූයේ,
(1) දාවිත් රජු සමයේ දී ය. (2) සලමන් රජු සමයේ දී ය.
(3) ජෙරබෝවම් රජු සමයේ දී ය. (4) අපර විප්‍රවාසි සමයේ දී ය.
(5) ග්‍රීක පාලන සමයේ දී ය.

**15.** ජුදා අන්තවාදී කණ්ඩායමක් වන සෙලට්වරුන්ගේ මූලික අරමුණ වූයේ කුමන පාර්ශ්වයට එරෙහිව යුධ කිරීම ද?
(1) රෝමවරුන් (2) පරිසිවරුන්
(3) සමරිතාන්වරු (4) හෙරෝද් රජ පවුල
(5) ලේකම්වරුන්

**16.** ජුදාවරුන් විසින් කුඩාරම් මංගල්‍යය සිදු කළ කාලය කුමක් ද?
(1) මාර්තු - අප්‍රේල් (2) නොවැම්බර් - දෙසැම්බර්
(3) සැප්තැම්බර් - ඔක්තෝම්බර් (4) අප්‍රේල් සහ දෙසැම්බර්
(5) ඔක්තෝබර් සහ දෙසැම්බර්

More Past Papers at
tamilguru.lk

[තුන්වැනි පිටුව බලන්න.

**17.** 'යොම් කිපූර්' යනු
(1) අස්වනු මංගල්‍යයකි. (2) පව් සමාවේ චාරිත්‍රයකි.
(3) මෞලි මංගල්‍යයකි. (4) දේව මාලිගාව කැප කිරීමේ මංගල්‍යයකි.
(5) දරු උපතක් සැමරීමකි.

**18.** ජුවාම්තුමාගේ (ජොහාන්තුමාගේ) ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේගේ මරණයට වගකිව යුතු වන්නේ,
(1) රෝමවරුන් ය. (2) සෙලට්වරුන් ය. (3) පරිසිවරුන් ය.
(4) එසෙන්ස්වරුන් ය. (5) ජුදාවරුන් ය.

**19.** පහත සඳහන් අයගෙන් එකම කණ්ඩායමකට ඇතුළත් කළ **නොහැකි** වන්නේ,
(1) පරිසිවරු ය. (2) සදුසිවරු ය. (3) ලේකම්වරු ය.
(4) එසේනිවරු ය. (5) ආණ්ඩුකාරවරු ය.

**20.** ජෙරුසලම් මන්ත්‍රණ සභාව පැවැත්වීමට තුඩුදුන් ප්‍රධාන කාරණය වූයේ,
(1) ග්‍රීක බසින් ජන වන්දනාව පැවැත්වීම ය.
(2) සබත් දින උපවාසය පිළිබඳව සලකා බැලීම ය.
(3) ජුදා නොවන ක්‍රිස්තියානීන් විසින් ජුදා නීතිය පිළිපැදිය යුතු බවට බල කිරීම ය.
(4) මළවුන්ගේ උත්ථානය පිළිබඳව උද්ගත වූ විවිධ මත පැවතීම ය.
(5) බොරු දිවැසිවරුන් විසූ නිසා ය.

**21.** පීඩන සම්බන්ධව පහත ප්‍රකාශ සලකන්න.
A - සභාව වඩ වඩාත් ශක්තිමත් වෙමින් වර්ධනය වීම
B - බොහෝ ක්‍රිස්තියානිහු මරණ බිය නිසා තම ධර්මය අතහැර දැමීම
C - ක්‍රිස්තියානිහු රෝම අධිරාජ්‍යය පෙරලා දැමීමට රහසේ සංවිධානය වීම
D - ක්‍රිස්තියානීන්ට තම ධර්මය උදෙසා සාක්ෂි දැරීමට අවස්ථාවක් උදා වීම
E - සභාව තුළ වීරවරයන් බිහිවීමට අවස්ථාව උදා වීම
මේවායින් රෝමානු පීඩන නිසා හටගත් ප්‍රතිඵල මොනවා ද?
(1) A, B සහ C (2) A, D සහ E (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**22.** පහත සඳහන් ප්‍රකාශවලින් ඇලෙක්සැන්ඩ්‍රියන් විද්‍යා පීඨය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) බැසිල් නමැති පූජකතුමන් විසින් ආරම්භ කරන ලදී.
(2) ආරම්භ කරන ලද්දේ පස්වන සියවසේ දී ය.
(3) ෆිලෝ නමැති ජුදා පඬිවරයා මෙහි නායකත්වය දැරුවෙකි.
(4) ශාන්ත අම්බ්‍රෝස්තුමන් මෙම විද්‍යා පීඨයේ ඉගැනුම ලැබුවෙකි.
(5) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය වඩාත් ඉස්මතු කර දැක්වී ය.

**23.** පහත සඳහන් ප්‍රකාශවලින් අන්තියෝකයේ විද්‍යා පීඨය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ඉස්මතු කර දැක්වීම සහ ඒරියන් වාදය පිළිගැනීම
(2) ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍යත්වය ඉස්මතු කර දැක්වීම සහ ප්ලේටෝගේ දාර්ශනික මත අනුගමනය කිරීම
(3) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍යත්වය ඉස්මතුකර දැක්වීම සහ ඇරිස්ටෝටල්ගේ දාර්ශනික මත අනුගමනය කිරීම
(4) ඒරියන් වාදය පිළිගැනීම සහ ශුද්ධ බයිබලය විවරණයේ දී වචනාර්ථයට මුල් තැන දීම
(5) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ඉස්මතු කර දැක්වීම සහ ඇරිස්ටෝටල්ගේ දාර්ශනික මත අනුගමනය කිරීම

**24.** සභා පියවරු සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - ඇලෙක්සැන්ඩ්‍රියාවේ විද්‍යා පීඨය හා සම්බන්ධ වූවෙකි.
B - ශුද්ධ වූ බයිබල් විවරණ රාශියක් ලියා ඇත.
C - ජීවිතයේ අවසාන කාලයේ දී මැනකියානු වාදය අනුගමනය කරන්නකු විය.
D - ක්‍රිස්තියානි ධර්මය වැළඳගත් නවකයන් ධෛර්යවත් කරන ලදී.
E - ශාන්ත ජෙරොම්තුමාගේ අනුගාමිකයෙකි.
මේවායින් ඔරිගන්තුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ E (4) B, C සහ E (5) C, D සහ E

**25.** මරියතුමිය දෙවියන් වහන්සේගේ මව බව ප්‍රකාශ කරන ලද්දේ කවර මන්ත්‍රණ සභාව ද?
(1) නිසියා (2) කොන්ස්තන්තිනෝපල් (3) කැල්සිඩොන්
(4) එපේසස් (5) ප්ලොරන්ස්

**26.** මුල් යුගයේ තාපස ජීවිතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ සඳහන් යුගලය තෝරන්න.
(1) ප්‍රාණ පරිත්‍යාගිභාවයට විකල්පයක් වශයෙන් තාපස ජීවිතය ඇරඹිණි. : තාපසවරු කණ්ඩායම් වශයෙන් විසූහ.
(2) පුරුෂ සහ කාන්තා යන දෙපක්ෂය ම තපස් ජීවිතයට ඇතුළු වූහ. : ශාන්ත බැසිල්තුමා පළමු තාපසතුමා ලෙස සැළකෙයි.
(3) තාපසවරු තනි තනි ව වෙසෙමින් භාවනාවේ සහ යාච්ඤාවේ නිරත වූහ. : තාපසවරු සිය කැමැත්තෙන් දිළිඳු ජීවිතයක් ගත කරමින් ව්‍රතශුද්ධිය ආරක්ෂා කළහ.
(4) තාපසවරු යාච්ඤා කිරීමට පමණක් එක් තැනකට රැස් වූහ. : ශාන්ත සිරිල්තුමා පළමු තාපසතුමා ලෙස සැලකෙයි.
(5) තපස්වරු සිරියාවේ සහ ඊජිප්තුවේ කාන්තාර හා වනගත ප්‍රදේශවල විසූහ. : පුරුෂ පක්ෂයේ අය පමණක් තපස් දිවියට ඇතුළු වූහ.

**27.** තාපසවරුන් සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - තාපසවරුන් තනි තනිව විසිය යුතුයැයි සැලකූහ.
B - බටහිර තාපසවරයේ පියා ලෙස සැලකෙයි.
C - තාපසවරු ක්‍රිස්තියානි ජීවිතයේ සහ ශුද්ධවන්තභාවයේ ආදර්ශය ලෙස සැලකූහ.
D - තාපසවරුන් වෙනුවෙන් නීති මාලාවක් සාදන ලදී.
E - තාපසවරුන් සංඛ්‍යාව වැඩි වූ විට ඔවුන් කණ්ඩායම් වශයෙන් වෙන් කරන ලදී.
මේවායින් ශාන්ත බැසිල්තුමා සම්බන්ධ ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, D සහ E (4) B, C සහ E (5) C, D සහ E

**28.** පහත ප්‍රකාශ අතුරෙන් ශාන්ත බෙනඩික්තුමා සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) ඉතාලියේ නූර්සියා නගරයේ ප්‍රභූ පවුලක උපත ලැබී ය.
(2) තාපසවරුන් වෙනුවෙන් නීති මාලාවක් සකසනු ලැබී ය.
(3) පනවන ලද නීති මාලාව තාපසවරුන්ට ක්‍රිස්තුන් වහන්සේ තුළ ගොඩනැගුණු ජීවිතයක් ගත කිරීමට ආධාර විය.
(4) පළමු තාපසාරාමය 'මොන්ටෙකසිනෝ' යන ස්ථානයෙහි පිහිටුවී ය.
(5) එතුමන් විසින් පිහිටුවන ලද තාපස නිකායේ ආදර්ශ පාඨය 'යාච්ඤාව සහ ඉගැන්වීම' යන්න ය.

**29.** පහත ප්‍රකාශ අතුරෙන් ගෝත්‍රිකයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තරමක් දියුණු අධ්‍යාපන ක්‍රමයකට හිමිකම් කීහ.
(2) පස්වන සහ හයවන ශත වර්ෂවල දී යුරෝපයේ සෑම ප්‍රදේශයක ම පාහේ ජීවත් වූහ.
(3) ක්‍රිස්තු වර්ෂ හත්වන ශත වර්ෂය වන විට විසිගොත්වරුන් විසින් රෝමය ආක්‍රමණය කරනු ලැබී ය.
(4) කාන්තාවන් ඉතා පහත් තත්ත්වයේ ලා සැලකූහ.
(5) රෝම ගෘහ නිර්මාණ ශිල්පය ආරම්භ කරන ලදී.

**30.** පහත ප්‍රකාශ අතුරෙන් යාචක නිකා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මධ්‍යගත යුගයේ දී යුරෝපය තුළ ආධ්‍යාත්මික නවෝදයක් ගෙනඒම සඳහා ය.
(2) පැවති තාපස ජීවිත ක්‍රමයට විරුද්ධ විය.
(3) යාචක නිකා අතර පළමුවැන්න ප්‍රැන්සිස්කන් පැවිදි නිකායයි.
(4) සාමාජිකයන් විසින් සභාවේ නායකයන් විවේචනය කිරීම නිසා සභාව විසින් යාචක නිකා තහනම් කරන ලදී.
(5) යාචක නිකා පිහිටවනු ලැබුවේ ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ යුගයේ දී ය.

**31.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය ඇතිවීමට බලපෑ හේතුවක් **නොවන්නේ** කුමක් ද?
(1) සභා නායකයන් ගත කරමින් සිටි ලෞකික ජීවිතය
(2) සභාව සහ ශුද්ධ වූ රෝම අධිරාජ්‍යය අතර පැවති බල අරගලය
(3) සභා නායකයන් දේශපාලන කටයුතුවලට මැදිහත් වීම සහ ලෞකික පාලකයන් සභාවේ කටයුතුවලට අනිසි ලෙස මැදිහත් වීම
(4) සභාව එක් පුද්ගලයකු විසින් පාලනය කිරීමට වඩා සභාවේ පාලනය විමධ්‍යගත කිරීම වඩාත් යෝග්‍යය යන අදහස ඇති වීම
(5) සභාවේ නායකයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් ගිහි විශ්වාසකයන් තුළ කලකිරීමක් ඇතිවීම

[පස්වැනි පිටුව බලන්න.

**32.** පහත ප්‍රකාශ සලකා බලන්න.

A - නව දේශයන් සොයා ගැනීම

B - පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස පහළ පන්තිවල සිටි ජනයාට සමාජයේ ඉහළ තත්ත්වයක් කරා යාමට හැකියාව ලැබීම

C - සභාව තුළ පැතිරෙමින් තිබූ නව ආකාරයේ වාදභේද

D - සමාජය තුළ පැවති නව චින්තනය

E - පැවිදි නිකා අතර පැවැති ගැටුම්

මේවායින් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට මඟ පෑදූ දේශපාලන හා සාමාජීය පසුබිම පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?

(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D
(4) B, D සහ E (5) C, D සහ E

**33.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් උල්රිච් ස්විංග්ලීතුමාගේ ඉගැන්වීම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සත්‍යය දැනගත හැකි එකම මාර්ගය වන්නේ ශුද්ධ බයිබලයයි. : සක්‍රමේන්තු යනු සංකේත පමණි.
(2) සත්‍යය දැනගත හැකි එකම මාර්ගය වන්නේ ශුද්ධ බයිබලයයි. : දිව්‍ය සත්ප්‍රසාදය තුළ සැබෑ ලෙසම ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින සේක.
(3) සක්‍රමේන්තු යනු සංකේත පමණකි. : ජනප්‍රිය භක්ති අභ්‍යාස පිළිපැදීම ධෛර්යවත් කළේ ය.
(4) 'ශුද්ධශිනිස්ථානය' යන්නක් පවතියි. : පූජක බඹසර රැකීමේ අවශ්‍යතාව පිළිගනු ලැබී ය.
(5) චතාරික උපවාසය දිරිගන්වයි. : පූජක බඹසර රැකීම පිළිගනු ලැබී ය.

**34.** කැපුචින් පැවිදි නිකාය සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ආරම්භ කරන ලද්දේ ප්‍රැන්සිස්කාන නිකායෙන් වෙන්ව ආ පැවිදිවරයෙකු විසිනි.
(2) කැපුචින් යනුවෙන් හැඳින්වෙන පළඳනාවක් හිසේ පැළඳි නිසා කැපුචින් නිකාය යනුවෙන් හැඳින්වී ය.
(3) අසීසියේ ප්‍රැන්සිස්තුමන් විසින් ආරම්භ කරන ලදී.
(4) සාමාජිකයෝ චාම් ජීවිතයක් ගත කරමින් සාමාන්‍ය ජනතාවට ගැළපෙන ආකාරයට ධර්ම දේශනා කළහ.
(5) හත්වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා ලෝකයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සහ දේශනා කිරීමට නීත්‍යානුකූල අවසරය දෙන ලදී.

**35.** පළමුවෙන් යුරෝපීය මිසම් පාසල් ආරම්භ කරන ලද පැවිදි නිකාය වන්නේ,

(1) ප්‍රැන්සිස්කානු නිකායයි.
(2) ජේසු නිකායයි.
(3) බෙනඩික්ටානු නිකායයි.
(4) දොමිනිකානු නිකායයි.
(5) අගුස්තිනු නිකායයි.

More Past Papers at
tamilguru.lk

**36.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ශාන්ත තෝමස් ඇක්වයිනස්තුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) 13 වන ශත වර්ෂයේ විසූ දේව ධර්ම ශාස්ත්‍රඥයෙකි
(2) අසීසියේ ප්‍රැන්සිස්තුමන්ගේ අනුගාමිකයෙකි
(3) සභා ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි
(4) බොලොඤ්ඤ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබුවෙකි
(5) 'දේව නගරය' නමැති ග්‍රන්ථයේ කතෘවරයයි

**37.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් 'ක්‍රිස්තු අනුසාරය' යන ග්‍රන්ථය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) අපර මධ්‍යගත යුගයේ දී ලියන ලද්දකි.
(2) කුරුසියේ ශුද්ධ වූ ජුවාම්තුමා විසින් ලියන ලදී.
(3) බටහිර භාෂාවන්ට පමණක් පරිවර්තනය කර ඇත.
(4) පාප කමාවේ දේව ප්‍රසාද නිධානය පිළිබඳ විස්තර කර ඇත.
(5) ආධ්‍යාත්මික ජීවිතය පහල මට්ටමක පැවති අවධියක ලියන ලද්දකි.

● පහත දක්වෙන වගුවේ **A** සිට **J** දක්වා සඳහන් කරුණු ඇසුරින් **38** සහ **39** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| දේව නගරය (City of God) | දෙව්ක පින්තාරු කරුවෙක් (Dirine Painter) | සුම්මා තියෝලොජී | ඉතාලි සාහිත්‍යයේ පියා | යහපත් ජීවිතයකට මග (The way of Perfection) |
| F | G | H | I | J |
| ආත්මයේ රාජධානිය | ජීවිත වාර්තාව (Confessions) | මෝනාලිසා | සුම්මා කොන්ත්‍රා ජෙන්තිලෙස් | දේව සුඛාන්තය (Divine Comedy) |

**38.** අවිලාහි තෙරේසා තුමියට සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A H (2) C J (3) D H (4) E F (5) E J

**39.** දාන්තේ අලිගියෙරිට සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A J (2) B I (3) C G (4) D F (5) D J

**40.** 1960 වසරේ පාසල් රජයට පවරා ගැනීම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - උසස් විදුහල් 40ක් රජයට පවරා දුනි.
B - දරුවන්ගේ ආගමික අධ්‍යාපනය පිළිබඳ දෙමව්පියන්ගේ උනන්දුව අඩු විය.
C - ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය පිහිටුවන ලදි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) A පමණි. (2) A සහ B පමණි (3) A සහ C පමණි
(4) B සහ C පමණි (5) A, B හා C සියල්ලම

**41.** ඉන්දියානු සභාව තුළ රෝමානු කතෝලික ජන වන්දනා ක්‍රම අනුගමනය කරන සභා මොනවා ද?
(1) සීරෝ මලබාර්, ලතින් හා තෝමස් ක්‍රිස්තියානියන්
(2) සිරියන් ක්‍රිස්තියානි, සීරෝ මලන්කාර හා ජැකොබයිට් සිරියන්
(3) සීරෝ මලන්කාර, සීරෝ මලබාර් හා ඕර්තඩොක්ස් සිරියන්
(4) මලංකාර සිරියන් ඕර්තඩොක්ස්, මාර් තෝමා හා ලතින් සභාව
(5) සිරෝ මලබාර්, සීරෝ මලක්කාර හා ලතින් සභාව

**42.** පිලිපීනයේ ශුභාරංචිය දේශනා කළේ,
(1) ප්‍රංශ ජාතිකයින් ය. (2) ඉතාලි ජාතිකයින් ය.
(3) උතුරු අමෙරිකානු ජාතිකයින් ය. (4) පෘතුගීසි ජාතිකයින් ය.
(5) ස්පාඤ්ඤ ජාතිකයින් ය.

**43.** පෘතුගීසි සමයේ දී ශ්‍රී ලංකාවේ ධර්මදූත සේවාවෙහි යෙදුණු පැවිදි නිකායන් හතර මොනවා ද?
(1) ප්‍රැන්සිස්කාන, බෙනදික්‍ාන සොමස්කන් හා ජේසු නිකායික
(2) ප්‍රැන්සිස්කාන, ජේසු නිකායික, දොමිනිකාන හා අගුස්තියාන
(3) නිමල මරිය, දොමිනිකාන, ක්ලැරිෂියක් හා අගුස්තියාන
(4) අගුස්තියාන, ප්‍රැන්සිස්කාන, බෙනදිකාන හා සැලේසියාන
(5) සැලේසියාන, ජේසු නිකායික, ප්‍රැන්සිස්කාන හා දොමිනිකාන

**44.** බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පාසල් වර්ග මොනවා ද?
(1) මිෂන් පාසල්, සෙමිනරි පාසල් හා රජයේ පාසල්
(2) රජයේ පාසල්, පිරිවෙන් පාසල් හා අනාථ පාසල්
(3) සෙමිනෙරි පාසල්, දේවස්ථාන පාසල් හා මිෂන් පාසල්
(4) රජයේ පාසල්, මිෂන් පාසල් හා පිරිවෙන් පාසල්
(5) රජයේ පාසල්, සෙමිනරි පාසල් හා පිරිවෙන් පාසල්

**45.** ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය යටතේ ක්‍රියාත්මක වන සමාජ සේවා ආයතනය කුමක් ද?
(1) කරිටාස් ශ්‍රී ලංකා සෙඩෙක් (SEDEC)
(2) තරුණ ක්‍රිස්තියානි සංගමය
(3) තරුණ ක්‍රිස්තියානි කාන්තා සංගමය
(4) ග්‍රීන් ආරෝග්‍ය ශාලාව
(5) රොටරි සමාජය

**46.** සමාජ සාධාරණත්වය ඉටු කිරීම සම්බන්ධයෙන් හඬ නැගූ ඇන්ග්ලිකානු සභා නායකයා කවුරුන් ද?
(1) ලියෝ නානායක්කාර රදගුරුතුමා
(2) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා
(3) මයිකල් රුද්‍රිගු පියතුමා
(4) මේරි බැස්ටියන් පියතුමා
(5) එච්.එස්. ඩේවිඩ් පියතුමා

**47.** පරිසරය සුරකීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ විශ්ව ලේඛනය තෝරන්න.
(1) ලෝක සාමය - Pacem in Terries
(2) මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරුවාණෝ - Redemptor Hominis
(3) සභාවේ සමාජ සහභාගිත්වය - Solicitudo Rei Socialis
(4) ප්‍රශංසා වේවා මා සමිඳුනි - Laudato Si
(5) ජනතා ප්‍රගතිය - Populorum Progressio

**48.** සභා සංවිධාන සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - 1957 දී බොම්බායෙහි ආරම්භ වූවකි.
B - 1957 දී ඉන්දුනීසියාවේ ආරම්භ වූවකි.
C - බෙදුණු සභා 100කට අධික ප්‍රමාණයක් ඒකාබද්ධ වූ සංවිධානයකි.
D - ශ්‍රී ලංකාව සාමාජික රටකි.
E - ආසියාව තුළ ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීම එක් පරමාර්ථයකි.
මේවායින් ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය (ACC) සම්බන්ධ ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**49.** කම්කරු ශ්‍රමයේ උදාරත්වය පිළිබඳ විශ්ව ලේඛනය ලියන ලද ශුද්ධෝත්තම පියතුමා කවුරුන් ද?
(1) XIII වන ලියෝ
(2) XXIII වන ජුවාම්
(3) VI වන පාවුලු
(4) II වන ජුවාම් පාවුලු
(5) XVI වන බෙනඩික්

**50.** අන්තර් ආගමික සබඳතාව පිළිබඳ සාකච්ඡා කර ඇති දෙවන වතිකානු කතිකාවේ ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
(1) ශුද්ධ වූ සභාව, ජනවන්දනාව, සභාවේ ධර්මදූත සේවාව, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව
(2) ශුද්ධ වූ සභාව, ජනමාධ්‍ය, ක්‍රිස්තියානි නොවන ආගම් සමග සභාවේ සම්බන්ධතාව, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව
(3) ශුද්ධ වූ සභාව, ක්‍රිස්තියානි ආගමික අධ්‍යාපනය, ක්‍රිස්තියානි නොවන ආගම් සමග සභාවේ සම්බන්ධතාව, සභාවේ ධර්මදූත සේවාව
(4) ශුද්ධ වූ සභාව, දේව ප්‍රකාශනය, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව, ක්‍රිස්තියානි එකමුතුකම
(5) ශුද්ධ වූ සභාව, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව, සභාවේ ධර්මදූත සේවාව, ක්‍රිස්තියානි නොවන ආගම් සමග සභාවේ සම්බන්ධතාව

* * *

More Past Papers at
tamilguru.lk

 0349

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ශුද්ධ වූ සුවිශේෂවල අන්‍ය ජාතිකයන් පිළිබඳ ව සඳහන් වන අවස්ථා **හතරක්** සඳහන් කරන්න.
   (ii) ශ්‍රාවකත්වය පිළිබඳ ව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් **හතරක්** ලියන්න.
   (iii) කන්ද උඩ දේශනයෙහි සඳහන් වන දේව රාජ්‍යය පිළිබඳ වටිනාකම් **හතරක්** සඳහන් කරන්න.
   (iv) දේව රාජ්‍යයෙහි ස්වභාවය පිළිබඳ ව කියැවෙන උපමා කථා **හතරක්** දක්වන්න.
   (v) ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියෙහි ඇණ ගැසීම පිළිබඳ ව සුවිශේෂයන්හි සඳහන් කරුණු **හතරක්** ලියන්න.
   (ලකුණු 4 × 5 = 20 යි)

2. (i) වෙදභේද **හතරක්** ඒවායේ මූලික ඉගැන්වීම් ද සහිතව සඳහන් කරන්න.
   (ii) කුරුස යුද්ධවල යහපත් සහ අයහපත් ප්‍රතිඵල **දෙක** බැගින් ලියන්න.
   (iii) සභාවේ දේවධර්මීය සහ ආධ්‍යාත්මික උන්නතිය සඳහා මුල් ක්‍රිස්තියානි චින්තකයන්ගේ දායකත්වයන් **හතරක්** ලියන්න.
   (iv) ශාන්ත අගුස්තීනුතුමන්ගේ ජීවිතය හා ඉගැන්වීම් පිළිබඳ ව කරුණු **හතරක්** සඳහන් කරන්න.
   (v) ඇලෙක්සැන්ඩ්‍රියානු විද්‍යා පීඨයේ ඉගැන්වීම් සම්බන්ධ කරුණු **හතරක්** ලියන්න.
   (ලකුණු 4 × 5 = 20 යි)

3. (i) ඉන්දියාවේ ලතින් සභාවේ ලක්ෂණ **හතරක්** ලියන්න.
   (ii) මාර් තෝමා සභාවේ ආරම්භය පිළිබඳ කරුණු **හතරක්** ලියන්න.
   (iii) ජපානයේ සභාව ආරම්භ කිරීමේ දී ජේසු නිකායෙන් ලද දායකත්වයන් **හතරක්** ලියන්න.
   (iv) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර සිටම ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ධර්මය පැවැති බවට සාධක **හතරක්** ඉදිරිපත් කරන්න.
   (v) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වර්ධනය කිරීමෙහි ලා බොන්ජීන් රදගුරුතුමන්ගෙන් සිදු වී ඇති සේවාව පිළිබඳ ව කරුණු **හතරක්** සඳහන් කරන්න.
   (ලකුණු 4 × 5 = 20 යි)

## II කොටස

4. (i) ශුද්ධ වූ පාවුලුතුමන්ගේ ලිපිවල 'දේව වරප්‍රසාදය' පිළිබඳ ව සඳහන් ඉගැන්වීම් ඇතුළත් සංක්ෂිප්ත රචනයක් ලියන්න.
   (ii) දේව වරප්‍රසාදයෙන් පුරවා ඇති ක්‍රිස්තියානීහු, දෙවියන් වහන්සේගේ මැවිල්ලක් වන පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම ඉටු කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
   (ලකුණු 10 × 2 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

**5.** (i) ක්‍රි.ව. 1054 දී සභාව පෙරදිග සහ අපරදිග වශයෙන් බෙදී වෙන් විය. මෙකී බෙදීමට හේතු වූ නායකත්වය පිළිබඳ ව සහ දේව ධාර්මික කරුණු විස්තර කරන්න.

(ii) සභාව ලෝකය තුළ දේව රාජ්‍යයේ සලකුණක් වන පිණිස ක්‍රිස්තියානි එකමුතුකමේ ඇති අවශ්‍යතාව පිළිබඳ ව පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**6.** (i) ආසන දේව මන්දිර ආශ්‍රිත ව ගොඩනැගූ පාසල් අධ්‍යාපනය යුරෝපීය සමාජයට ලබාදුන් සාධනීය දායකත්ව අගයන්න.

(ii) රටක බහු ආංගික අභිවෘද්ධියය සඳහා පාසල් අධ්‍යාපනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**7.** (i) ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලන සමයේ කතෝලික ධර්මයේ උන්නතිය උදෙසා සාහිත්‍යය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, රංග කලාව ආදිය උපයෝගී කරගත් ආකාරය සාකච්ඡා කරන්න.

(ii) වර්තමානයේ සමාජය තුළ ක්‍රිස්තියානි වටිනාකම් ප්‍රචලිත කිරීම සඳහා සාහිත්‍ය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව සහ සමාජ මාධ්‍යය ආදිය යොදගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**8.** (i) විවාහ ජීවිතය සහ පවුල සම්බන්ධයෙන් දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ 'නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව' ප්‍රකාශයේ සඳහන් ඉගැන්වීම් මොනවා දැයි විස්තර කරන්න.

(ii) ක්‍රිස්තියානි පවුල තුළ වර්ධනය වෙමින් පවතින ගැටුම් හා ව්‍යාකූලත්වය හමුවේ ප්‍රීතිමත් සහ යහපත් පවුල් ජීවිතයක් ගොඩනැගීමට දරුවන්ගේ භූමිකාව පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

* * *

More Past Papers at
tamilguru.lk